COLOMBO STOCK EXCHANGE

# මාධ්‍ය නිවේදනය

## 2019 ජනවාරි මස 07 වන දින

කොළඹ :

## **<u>ඩිස්ටිලරිස් (DCSL) සහ මෙල්ස්ටාස්කෝප් (Melsta) සමාගම්වල සාංගමික කටයුතු සේවා සැපයීමට CDS ගිවිසුමකට එළඹෙයි.</u>**



වමේ සිට දකුණට :

CDS සහාය කළමනාකරු නදීර අතුකෝරාල මහතා, CSEහි නීතිමය කටයුතු ප්‍රධානී රේණු රණතුංග මහත්මිය, CDS ප්‍රධානී නලින් ෆොන්සේකා මහතා, CSEහි ප්‍රධාන විධායක නිලධාරී රජීව බණ්ඩාරනායක මහතා, මෙල්ස්ටාස්කෝප් සහ ඩිස්ටිලරිස් කොම්පැනි ඔෆ් ශ්‍රී ලංකා සමාගම්වල අධ්‍යක්ෂ නියෝමාල් බාලසූරිය මහතා, මෙල්ස්ටාස්කෝප් සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂ අමිත ගුණරත්න මහතා, ඩිස්ටිලරිස් කොම්පැනි ඔෆ් ශ්‍රී ලංකා සහ මෙල්ස්ටාස්කෝප් සමාගම්වල සමූහ මූල්‍ය පාලක ක්ලීටස් මල්ලවාරච්චි මහතා, CDSහි පාරිභෝගික සබඳතා කළමනාකරණ සහාය කළමනාකරු හේමාල් වීරසිංහ මහතා, ඩිස්ටිලරිස් කොම්පැනි ඔෆ් ශ්‍රී ලංකා සහ මෙල්ස්ටාස්කෝප් සමාගම්වල නීතිමය කටයුතු නිලධාරී නුවන්ති ගුණවර්ධන මහත්මිය.

කොළඹ කොටස් හුවමාරුවෙහි (CSE) පූර්ණ හිමිකාරිත්වය සහිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රම පුද්ගලික සමාගම (CDS) විසින් ඉටුකරනු ලබන සාංගමික කටයුතු සේවා සහ රෙජිස්ට්‍රාර් සේවා ලබාගැනීමට ඩිස්ටිලරිස් කොම්පැනි ඔෆ් ශ්‍රී ලංකා (DCSL) සහ මෙල්ස්ටාස්කෝප් (Melsta) පුද්ගලික සමාගම් ගිවිසුමකට එළඹී ඇත. මෙම සේවාව CDS ආයතනය විසින් 2018 වර්ෂයෙහිදී දියත් කල අතර වර්තමානයේදී කර්මාන්ත ක්ෂේත්‍ර 8ක් නියෝජනය කෙරෙන සමාගම් 18ක් සඳහා මෙම සේවාව සපයනු ලැබේ. මෙම ගිවිසුම අනුව CDS ආයතනය ඩිස්ටිලරිස් කොම්පැනි ඔෆ් ශ්‍රී ලංකා (DCSL) සහ මෙල්ස්ටාස්කෝප් (Melsta) පුද්ගලික සමාගම් සඳහා කොටස් ලෙජර් පවත්වා ගැනීම, මුදල්/කොටස් ලාභාංශ නිකුතු, හිමිකම් නිකුතු, කොටස් විභජනනය, සංචිත ප්‍රාග්ධනීකරණය සහ අනිකුත් සාංගමික කටයුතු යනාදීය සඳහා රෙජිස්ට්‍රාර් සේවා සපයනු ලැබේ.

මෙම නවතම සේවාව CDS ආයතනය විසින් හඳුන්වාදීමේ මූලික හේතුව වූයේ ලොව පුරා ඇති තැන්පතු ආයතන ගණනාවක් සිය සම්ප්‍රාදායික එදිනෙදා කටයුතු පුළුල් කරමින් පාරිභෝගික හිතකර නව සේවා සහ තාක්ෂණය වැඩි දියුණු කිරීමට දැක්වූ ප්‍රවණතාව සමගයි.

මෙම ගිවිසුම පිළිබඳව අදහස් දක්වමින් මධ්‍යම තැන්පතු ක්‍රමයෙහි ප්‍රධානී නලින් ෆොන්සේකා මහතා සඳහන් කළේ “ අපේ සංවර්ධන ක්‍රියාදාමයේදී නව යුගයක් සලකුණු කරමින් CDS ආයතනය විසින් ආරම්භ කල මෙම නවතම සාංගමික කටයුතු සේවා සහ රෙජිස්ට්‍රාර් සේවාව මගින් ගනුදෙනුකරුවන්ට වඩාත් හොඳ සේවාවන් ලබාදීමට අවකාශය ලැබෙනවා. අපගේ සේවාදායක ආයතන අතරට ඩිස්ටිලරිස් (DCSL) සහ මෙල්ස්ටාස්කෝප් (Melsta) පුද්ගලික සමාගම් සාදරයෙන් පිළිගනු ලබන අතර අපගේ සේවා පිළිබඳව තබා ඇති විශ්වාසය තහවුරු කිරීමට අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.” යනුවෙනි.

“ලැයිස්තුගත සමාගමකට සාංගමික කටයුතු සේවා සහ රෙජිස්ට්‍රාර් සේවා අත්‍යවශ්‍ය සේවා වන අතර CDS වෙළෙඳපොළෙහි වසර 25කට අධික පළපුරුදු ආයතනයක් ලෙස මෙම නව සාංගමික කටයුතු සේවා තුලින් ලැයිස්තුගත සමාගම් හට පුළුල් වූ සහ කාර්යක්ෂම සේවාවක් ලබාදීමට අපට හැකි වී තිබෙනවා”යනුවෙන් එතුමා තවදුරටත් සඳහන් කළේය.

**වැඩි විස්තර www.cse.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.**

**කොළඹ කොටස් හුවමාරුව පිළිබඳව:**

**කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකාවේ එකම කොටස් වෙළෙඳපොළ ලෙස ක්‍රියාත්මක වන අතර එමගින් ලයිස්තුගත සමාගම් හා ආයෝජකයන්ට හමුවීම සඳහා අවශ්‍ය පාරදෘශ්‍ය හා විධිමත් පරිසරය සකස් කෙරෙයි. සාමාජික ආයතන 15 කින් හා ගනුදෙනුකරන සාමාජික ආයතන 14 කින් සමන්විත මෙය ශ්‍රී ලංකාවේ නෛතික රාමුවට අදාලව ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබෙන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව මගින් අධිකාරිය ලබා තිබේ. මෙම සියලුම සාමාජික ආයතන හා ගනුදෙනුකරන සාමාජික ආයතන කොටස් තැරැව්කරුවන් ලෙස ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව මගින් බලපත්‍ර ලබාගත යුතුය. වැඩි විස්තර www.cse.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.**

**වැඩි විස්තර සඳහා අමතන්න ,**
**නිරෝෂන් විජේසුන්දර , කොළඹ කොටස් හුවමාරුව**

**දුරකථන : + 94 112356510, ජංගම දුරකථන : + 94 777 819999, ෆැක්ස් : + 94 112445279**

**විද්‍යුත් තැපැල : niroshan@cse.lk**